පාර්ලිමේන්තු ප්‍රශ්න මාලා අංකය :- 489

ආයතනයේ නම : වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் : 489

நிறுவனத்தின் பெயர் : வனப் பாதுகாப்புத் திணைக்களம்

பாராளுமன்றத்தின் அரசாங்கக் கணக்குகள் பற்றிய குழுவினால் சமர்ப்பிக்கப்பட்ட அறிக்கை தொடர்பில் நிலையியற் கட்டளை 119(4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புகளையும் எடுத்த நடவடிக்கைகளையும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

Parliamentary Series No : 489

Name of the institution: Department of Forest Conservation

Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the committee on public Accounts in terms of Standing Order NO. 199(4)

2020,2021 හා 2022 වර්ෂ සඳහා විගණකාධිපති වාර්තාවල ඇතුළත් කරුණු සහ වර්තමාන කාර්ය සාධනය

(විමර්ශනය කරන ලද දිනය - 2024 ජූලි 25)

අනු අංකය	කාරණය/යොමුව	නිර්දේශය	ප්‍රගතිය
01	<u>දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය.</u> දෙපාර්තමේන්තුවේ විෂය ක්ෂේත්‍ර , ප්‍රධානීන් අතර බෙදී යාම සම්බන්ධයෙන් යම් ගැටළුමය තත්වයක් පවතින බව කාරක සභාව නිරීක්ෂණය කළේය. එහිදී විෂය ක්ෂේත්‍රයන් ගණනාවක්ම එක් තනතුරකින් පාලනය සිදුවන බව කාරක සභාව පෙන්වා දුන්නේය . එක් එක් අංශයේ ප්‍රධානීන් සතුවිය යුතු විද්‍යාත්මක දැනුම එක් එක් විෂය ක්ෂේත්‍රයේ වන සංරක්ෂකවරුන් පාලනය කරන ප්‍රධානීන්ට නොමැතිවීම කෙරෙහි කාරක සභාවේ දී සැලකිල්ලට භාජනය විය.	මෙම කරුණ සම්බන්ධයෙන් මුදල් , ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ කඩිනම් අවධානය යොමුකරන ලෙසට කාරක සභාව දන්වා සිටි අතර , අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනයට ලක්කර හෝ වන සංරක්ෂක සේවාවේ නිලධාරීන් අවම වශයෙන් දෙදෙනෙකුවත් අතිරේක වන සංරක්ෂක ජනරාල් ධුර සඳහා පත් කිරීමට කටයුතු කරන ලෙසත් කාරක සභාව යෝජනා කර සිටියේය.	වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සඳහා ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ විශේෂ ශ්‍රේණියේ අතිරේක වන සංරක්ෂක ජනරාල් තනතුරු 02ක්, වන ආරක්ෂණ,කළමනාකරණ මෙහෙයුම් සහ පර්යේෂණ, අධ්‍යාපන හා පුහුණු ලෙස අනුමත වී ඇත. අතිරේක වන සංරක්ෂක ජනරාල් (පර්යේෂණ,අධ්‍යාපන හා පුහුණු) යටතට අධ්‍යාපන හා පර්යේෂණ ආයතනද අතිරේක වන සංරක්ෂක ජනරාල් (වන ආරක්ෂණ කළමනාකරණ මෙහෙයුම්) යටතට, i. ආරක්ෂණ හා නීති ක්‍රියාත්මක කිරීම් අංශය ii. ජෛව විවිධත්ව හා ජලාධාර සංරක්ෂණ අංශය iii. පාරිසරික සංචාරක අංශය iv. සමාජ වන විද්‍යා හා වන ව්‍යාප්ති අංශය v. භූ විද්‍යා තොරතුරු හා වන සංගණන අංශය vi. වන විද්‍යා හා වන වගා කළමනාකරණ අංශය vii. පරිසර කළමනාකරණ හා භූ සම්පත් අංශය viii. සැලසුම් හා ප්‍රගති පාලන අංශය ලෙස අංශ 08ක් ද අයත් වේ.

			එම අංශ 08 හි කටයුතු අදාල අංශ භාර වන සංරක්ෂකවරුන් යටතේ සිදු වන අතර අධීක්ෂණ කටයුතු අතිරේක වන සංරක්ෂක ජනරාල් (වන ආරක්ෂණ කළමනාකරණ මෙහෙයුම්) යටතේ සිදු කරනු ලබයි. ඒ අනුව, මෙම දෙපාර්තමේන්තුවේ රාජකාරි ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ විශේෂ ශ්‍රේණියේ අතිරේක වන සංරක්ෂක ජනරාල්වරු දෙදෙනා යටතේ ප්‍රශස්ථ මට්ටමින් ඉටු කෙරෙමින් පවතී.
02.	<u>හිඟ සේවක ණය ශේෂයන් ආපසු අයකර ගැනීම පිළිබඳව</u>. එම හිඟ ණය ශේෂය රු.මිලියන 13ක පමණ විශාල අගයක් ගන්නා බව විගණන අංශ මඟින් පෙන්වා දුනි.	කාරක සභාවේ නිර්දේශයට අනුව එම මුදල් අයකර ගැනීමට කටයුතු කළ අතර , ගත් ක්‍රියා මාර්ග අනුව ඉන් රුපියල් මිලියන 06ක් අයකරගෙන වර්තමානයේ දී එම හිඟ ණය ශේෂය රු.මිලියන 1.9 දක්වා අඩුකර ගැනීමට හැකි වූ බවත් එම රු.මිලියන 1.9ට අදාළව සේවය අතහැර ගිය , සේවකයන්ගෙන් ඉදිරියේ දී තව දුරටත් මුදල් අයකර ගැනීමට කටයුතු කරන බවත් , එසේ අයකර ගැනීමට නොහැකි පුද්ගලයින් සඳහා රාජ්‍ය පරිපාලන වක්‍ර ලේඛ 01/2024 අනුව කටයුතු කිරීමට බලාපොරොත්තුවන බවත් , වන ජීවී හා වන සම්පත් අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි/ග.නි. කාරක සභාව හමුවේ ප්‍රකාශ කර සිටියේ ය.	විමර්ශනය කරන ලද දිනය වනවිට රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමේ අයවීමට තිබූ රු.මිලියන 13.9ක ණය ශේෂයන්ගෙන් 2026 මුදල් වර්ෂයේ පළමු කාර්තුව අවසන්වන විට රු.මිලියන 7.7ක ණය ශේෂයක් නිරවුල් කර ඇති අතර, තවදුරටත් රු.මිලියන 6.2ක ණය ශේෂයක් නිරවුල් කිරීමට ඇත. ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදය හා එහි සංශෝධිත විධිවිධාන , මුදල් අමාත්‍යාංශ වක්‍රලේඛ අනුව කටයුතු කර එම හිඟ ණය ශේෂයන් කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කරමි.

03.	<u>දැනට ගැසට් මඟින් ප්‍රකාශයට පත් නොකළ හෙක්ටයාර 250,000ක් වන වනාන්තර ගැසට් කිරීම.</u> දිසාවන කාර්යාල 25ක් යටතේ පාලනය වන , වන බිමි ප්‍රමාළණයෙන් රක්ෂිත හා සංරක්ෂිතයන් ලෙස ගැසට් කර ඇති ප්‍රමාණය හෙක්ටයාර මිලියන 1.4ක ප්‍රමාණයක් බව විගණන අංශ මඟින් පෙන්වා දෙන ලදී.ඉතිරි භූමි ප්‍රමාණයේ මැනුම් කටයුතු අවසන් කර නොනිබීම තුළ අනවසර ඉඩම් අල්ලා ගැනීම්, දැව හෙළීම් හා වන අපරාධ ආදිය බහුලව සිදුවන බවට කාරක සභාව හමුවේ ප්‍රකාශ විය.	විගණකාධිපති වාර්තාවට අනුව ගැසට් කළ යුතු වනාන්තර ප්‍රමාණය වන හෙක්ටයාර 309000ක බිම් ප්‍රමාණය දිස්ත්‍රික් හා කලාප මට්ටමින් බෙදා වැඩ පිළිවලක් සකස්කර , එහි වහකීම් දිස්ත්‍රික් හා කලාප මට්ටමින් දෙපාර්තමේන්තු නිලධාරන්ට පවරා , මැනුම් කටයුතු අවසන් කිරීම ඇතුළු ඉදිරි වසර 05 තුළ කළ යුතු වැඩ පිළිවෙළ පෙළ ගස්වා , ඒ සම්බන්ධයෙන් දින වකවානු ඇතුළත් වාර්තාවක් සකස් කර 2024 සැප්තැම්බර් 25 දිනට පෙර කාරක සභාව වෙත යොමුකරන ලෙස වන ජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරී (ප්‍ර.ග.නි)/ගණන් දීමේ නිලධාරී (ග.නි) වෙත කාරක සභාව විසින් නිර්දේශ කරන ලදී.	2024, 2025, 2026 යන වර්ෂයන් හි පහත සඳහන් පරිදි වනාන්තර හෙක්ටයාර 70,000 ගැසට් මඟින් ප්‍රකාශයට පත් කර ඇත. • 2024.08.08 , 2024.09.04 දිනයන් හි වව්නියාව දිස්ත්‍රික්කයේ වනාන්තර 14 ක් • 2024.09.05 , 2025.06.05 දිනයන් හි පරිසර දිනය සඳහා වනාන්තර 05 ක් • 2025.07.15 දින වනස්පති වැඩසටහන සඳහා වනාන්තර 16 ක් • 2025.07.26 දින කඩොලාන දිනය සඳහා වනාන්තර 08 ක් • 2026.03.23 දින ජාත්‍යන්තර වනාන්තර දිනය සඳහා වනාන්තර 50 ක් • 2026.04.24 දින සාම පා ගමන සඳහා වනාන්තර 01 ක්

04.	නිශ්චිතව ලංකාවේ වනාන්තර ගැසට් කර නොතිබීම හේතුවෙන් විවිධ ව්‍යාපෘති හා සංවර්ධන යෝජනා ක්‍රම වලදී මතුව ඇති ගැටලු.	කිකිලියාමාන කන්දේ කේබල් කාර් ව්‍යාපෘතිය සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අවසරය නොලැබීම පිළිබඳව සාකච්ඡාවට ගත් අතර අදාළ ව්‍යාපෘතිය සඳහා නොඉදුල් කඳුකර වනාන්තරයේ (Montane forest) අක්කරයක පමණ බිම් ප්‍රමාණයක් ඉල්ලා සිටි බැවින් ඒ සඳහා අවසර ලබා නොදුන් බව වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි/ග.නි. ප්‍රකාශ කළේය.	**"තිරසර වනාන්තර කළමණාකරනය තුලින් ඉඩම් ගැටළු නිරාකරණය කිරීම "** වැඩසටහනට අදාලව හා **"වනස්පති ජාතික වැඩසටහනට"** අදාලව ගැසට් නොකළ ඉඩම් හදුනාගෙන රක්ෂිත වශයෙන් ප්‍රකාශයට පත් කිරීම සිදුවෙමින් පවති.
05.	වල්ලපට්ටා වගාව සහ එම වගාවේ දැව ප්‍රවාහනය කිරීමට ඇති බාධා.	මේ සම්බන්ධයෙන් විද්‍යාත්මක ක්‍රමවේදයක් පිළිබඳව සොයා බලා වාර්තාවක් සකස් කර 2024 සැප්තැම්බර් 25 දින වනවිට කාරක සභාව වෙත යොමු කරන් ලෙස වන ජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි/ග.නි වෙත කාරක සභාව විසින් නිර්දේශ කරන ලදී.	වල්ලපට්ටා (Gyrinops walla) සහ එයට සමාන විදේශීය ශාක විශේෂය වන Aquilaria ශාක කොටස් ප්‍රවාහනය සඳහා, ප්‍රවාහන බලපත්‍ර ලබා ගැනීමේ ක්‍රියාවලිය අහෝසි කිරීම නිර්දේශ කළ නොහැක. එසේ වුවද එම ප්‍රවාහන බලපත්‍ර කඩිනමින් නිදහස් කිරීම සඳහා අදාළ ක්ෂේත්‍ර නිලධාරීන්ට අවශ්‍යය උපදෙස් නිකුත් කර ඇත. එසේම, වානිජ මට්ටමින් සිදුකරනු ලබන සියලු වල්ලපට්ටා සහ Aquilaria වගාවන් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ලියා පදිංචිය සඳහා ක්‍රමවේදයක් සකස් කරමින් පවති. තවද වල්ලපට්ටා සහ Aquilaria ශාක කොටස් භාවිතකර විවිධ නිෂ්පාදන සිදුකරන පාර්ශවයන් මෙම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිකර, ලියාපදිංචි සහතිකයක් නිකුත් කිරීමට අවශ්‍යය පියවර ගෙන ඇත. එම ලියාපදිංචි සහතිකය පරීක්ෂාකර ප්‍රවාහන බලපත්‍ර කඩිනමින් නිකුත් කිරීමට අවශ්‍යය පියවර ගෙන ඇත.

<table>
<tr>
<td>06.</td>
<td>පාරිසරික සංචාරක කර්මාන්තය වැඩි දියුණු කිරීම හා නඩත්තු කිරීම සඳහා ප්‍රමාණවත් වැඩපිළිවෙළක් 2024 වර්ෂය වන විටත් ස්ථාපිත කර නොතිබීම.</td>
<td>දැනට දෙපාර්තමේන්තුව මඟින් සංචාරකයින් සඳහා ස්ථාන 26ක් පවත්වාගෙන යන බවත් , මෙම ස්ථාන මඟින් 2023 වර්ෂයේ දී රු.මිලියන 172ක් හා 2024 වර්ෂයේ මුල් මාස 7 තුළ පමණක් රු.මිලියන 243ක පමණ ආදායමක් උපයා තිබෙන බවත් , වන ජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි/ග.නි විසින් කාරක සභාව හමුවේ ප්‍රකාශ කරන ලදී. එමෙන්ම සිංහරාජ වනාන්තරය නැරඹීම සඳහා 35000ක් පමණ වැඩිම සංචාරකයින් සංඛ්‍යාවක් 2024 වසරේ දී පැමිණ තිබෙන බවද හෙතෙම වැඩිදුරටත් සඳහන් කළේය.</td>
<td>දෙපාර්තමේන්තුවේ පවතින පාරිසරික සංචාරක ගමනාන්ත නඩත්තු කිරීම හා වැඩිදියුණු කිරීම සඳහා සැලසුම් සෑම වර්ෂයකම සකස් කර, ක්‍රියාත්මක කිරීමට 2024 වර්ෂයේ සිට පහත පරිදි පාරිසරික සංචාරක කටයුතු සඳහා ප්‍රතිපාදන ලැබී ඇත.

<table>
<tr><th>වර්ෂය</th><th>ලැබී ඇති ප්‍රතිපාදන රු.මිලි.</th></tr>
<tr><td>2024</td><td>79</td></tr>
<tr><td>2025</td><td>109</td></tr>
<tr><td>2026</td><td>132</td></tr>
</table>

එම ප්‍රතිපාදන ලැබීම මත වාර්ෂික සැලසුම් සකස් කර ක්‍රියාත්මක කර, ඇත. 2024 වසර සඳහාද රුපියල් මිලියන 79.00 ලැබී ඇති අතර, ඊට අදාලව වාර්ෂික සැලැස්ම යටතේ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. 2026 වර්ෂයේද පවතින සංචාරක ගමනාන්ත හා වැඩිදියුණු කිරීමටද වාර්ෂික සැලසුම් සකස් කර අනුමත කර ඇත. ඒ යටතේ ගමනාන්ත නඩත්තු කිරීම, වැඩිදියුණු කිරීම,ගවේෂණයකිරීම , ප්‍රවර්ධන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම හදුනා ගෙන ඇත.

ඊට අමතරව වනාන්තර තුල සංරක්ෂිත වටිනාකම් ආරක්ෂා වන පරිදි පමණක් සංචාරක කර්මාන්තය</td>
</tr>
</table>

			වැඩිදියුණු කල යුතු බැවින් ලෝක බැංකු ආධාර යටතේ ඉහල වටිනාකමක් ඇති සංචාරක ගමනාන්ත සකස්කිරිමට හා දැනට පාරිසරික සංචාරක සැලසුම් සකස් කර ඇති සිංහරාජ, නකල්ස්, හුරුළු, ගල්විල යන ගමනාන්ත වල හදුනාගත් ක්‍රියාකාරකම් සිදුකිරීමද ඇතුලත්ව වසර 05ක ව්‍යාපෘතියක් 2027 වසර සිට ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති අතර, ඒ සඳහා මූලික සැලසුම් කටයුතු සිදු කිරීමට රුපියල් මිලියන 01 ප්‍රධානයක් ලෝක බැංකුව මඟින් පරිසර අමාත්‍යාංශය වෙත මෙම වසරේ ලබා දීමට තීරණය කර ඇත .
07.	<u>පූර්ණ හෙලීම් කිරීම සඳහා රාජ්‍ය දැව සංස්ථාව වෙත භාර දෙන ලද වන වගා නියමිත කාලය තුළ සිදු නොකිරීම නිසා ගැටළු ඇති වීම.</u> වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් පූර්ණ හෙලීම් කිරීමට යෝජිත වන වගා නියමිත කාලය තුළ සිදු නොකිරීම නිසා දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරී	2021 වර්ෂයේ සිට දැව හෙලීම සඳහා රාජ්‍ය දැව සංස්ථාවට පෙර වසරට සාපේක්ෂව විශාල භූමි ප්‍රමාණයක් ලබා දීම හා කොවිඩ් අර්බුදය හේතුවෙන් අදාළ කාලය තුළ සම්පූර්ණයෙන් දැව හෙලීමට නොහැකි වීම නිසා මෙම ගැටලුව පැන නැඟුනබව රාජ්‍ය දැව සංස්ථාවේ නිලධාරීන් විසින් කාරක සභාව හමුවේ ප්‍රකාශ කරන ලදී. එමෙන්ම ෆයිනස් වගාව ලංකාවෙන් ඉවත් කිරීමට 2020 වර්ෂයේ දී පැමිණි යෝජනා අනුව කටයුතු කිරීමත් සමඟ දැව හෙලීම සඳහා රාජ්‍ය දැව සංස්ථාවට ලබා දුන් භූමි ප්‍රමාණය ද විශාල වීම සිදු වූ බවත් , ඉතිරි ප්‍රමාණය 2025 වර්ෂය අවසාන වන විට කපා ඉවත් කළ හැකිබවත් රාජ්‍ය	2021 වර්ෂයේ සිට රාජ්‍ය දැව සංස්ථාව වෙත ලබාදුන් වන වගා නැවත භාර දීමේ ප්‍රමාදයක් තිබුණු අතර ඒ සඳහා කොවිඩ් වසංගත තත්වය, ඉන්ධන හිඟය හා ඉන්ධන මිල ඉහල යාම මත කොන්ත්‍රාත් කරුවන් වැඩ වලින් ඉවත් වීම වැනි කරුණු හේතු විය. නමුත් පසුගිය වසරේ සිට එම තත්වයක් සමනය වී රටේ යම් ස්ථාවරත්වයක් පැමිණීමත් සමඟ 2021 වර්ෂයේ සිට එකතු වූ වන වගා හෙලීම් කටයුතු අවසන් කර එම බිම් කට්ටි වල නැවත වගා ඇති කර ඇත.ඒ අනුව 2026 වර්ෂය සඳහා කළුතර හා රත්නපුර දිසාවන් හි පිහිටි බිම් කට්ටි 04 ක් පමණක් එනම් හෙක්ටයාර 81.5 ක් හෙලීම් මෙම වසර තුලදී අවසන් කිරීමට නියමිත අතර මෙම

	සැලැස්මට අනුව නැවත වන වගා කිරීම සඳහා සිටු වීමට යෝජිත පැල වර්ග තවාන් තුළම විශාල වීම හා නඩත්තු කිරීම් සඳහා විශාල මුදලක් වැය වීම සම්බන්ධයෙන් කාරක සභාව විසින් විසමන ලදී.	දැව සංස්ථාවේ නිලධාරීන් වැඩිදුරටත් ප්‍රකාශ කළ හ. මේ සඳහා අවශ්‍ය පරිදි වසර 10ක හෝ සැලසුමක් සකස්කර වන හෙළිම් සිදු කරන ලෙස කාරක සභාව විසින් රාජ්‍ය දැව සංස්ථාවේ නිලධාරීන් වෙත උපදෙස් දුන්නේ ය.	වසර අවසානය වන විට 2021 වර්ෂයේ සිට ඉතිරි වී තිබූ හෙළිම් කටයුතු සියල්ල අවසාන වනු ඇත.
08.	දියතලාව හමුදා කඳවුර ආශ්‍රිතව හෙක්ටයාර 42ක ෆයිනස් වගාව සම්පූර්ණයෙන් හෙළිකර නැවත සිටු වීමට සූදානම්ව තිබුණ ද එය නිසි අයුරින් සිදු නොකිරීම නිසා නැවත සිටුවීමට වවන ලද පැල නඩත්තුවට රු.මිලියන 6ක පමණ මුදලක් වැයවීම හා එම පැල විනාශවෙමින් පැවතීම.	2021 වර්ෂයේ දී ෆයිනස් වගාව ලංකාවෙන් ඉවත්කර කෙටිකාලයක් තුළ දී දේශීය වනවගාව බවට පරිවර්තනය කිරීමේ රාජ්‍ය ප්‍රතිපත්තිය අනුව , මෙම කඳවුර අසල ෆයිනස් වගාව හෙක්ටයාර 100ක් පමණ ඉවත් කර දේශීය වන වගාව කිරීමට කටයුතු ආරම්භ කළ බවත් , දියතලාව හමුදා කඳවුර තුළ පිහිටි වන වගාවක් බැවින් හමුදා කඳවුරේ නීතිරීති වලට අනුකූලව සීමිත කාල සීමාවල් තුළ දැව හෙළිම සිදුකළ යුතු බවත් දෙපාර්තමේන්තු නිලධාරීන් විසින් ප්‍රකාශ කරන ලදි . එම කටයුතු සොයා බලන ලෙස කාරක සභාව උපදෙස් දුන්නේය.	2021 වර්ශයේ පයිනස් වන වගා කඩිනමින් ඉවත් කර දේශීය වන වගා බවට පත් කර කිරීමට රජය විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණයකයට අනුව මෙම භූමියේ පිහිටි පයිනස් වන වගා හෙක්ටයාර 100 ක් හෙළිම් අරඹන ලද අතර මෙම වන වගාව වෙඩි පිටිය වටා ඇති බැවින් උණ්ඩ වල අවධානම අඩු කිරීම වැනි කරුණු සලකා බලා උක්ත වන වගාවේ හෙක්.42 ක තීරු ලෙස පයිනස් ගස් හෙළිම රාජ්‍ය දැව සංස්ථාව විසින් ආරම්භ කරන ලදි. කෙසේ වෙතත් 2021 වර්ෂයෙන් පසු රටේ ඇතිවූ විවිධ ගැටළුකාරී තත්ත්වයන් (කොවිඩ් වසංගතය ,ආර්ථික අර්බුදය හමුවේ ඉන්ධන හිඟ වීම හා ඉන්ධන මිල ඉහල යාම, යන්ත්‍ර සූත්‍ර නඩත්තු හා අමතර කොටස් ඉහල යාම) මත හෙළිම් කටයුතු අපේක්ෂිත ආකාරයට සිදු කර ගැනීමට නොහැකි විය.

			තවද මෙම බිම් කොටස යුධ හමුදා කඳවුරක් වීම හා ආරක්ෂිත ප්‍රදේශයක් වීම නිසා සාමන්‍ය වැඩ බිමක් ආකාරයට ඒ තුල සේවකයන් වාඩි තුල නවත්වා හෙලීම් කිරීමට නොහැකි වී ඇත. තවද මාසයේ හමුදා පුහුණු නොමැති දින වල පමණක් හෙලීම් කටයුතු සඳහා අවසර ලබා දී ඇත.මේ කරුණු මත 2025 වර්ෂය වන විට හෙලීම් අවසන් කිරීමට හැකි වී ඇත්තේ හෙක්ටයාර් 14 ක පමණි.මෙහි පැල සිටුවීම සඳහා යුද හමුදාවේ ශ්‍රම දායකත්ව ලබා ගැනීමට සැලසුම් කර තිබුණද එම දායකත්වය නොලැබී යාම තුල තවදුරටත් හෙලීම් කිරීමට අවසර ලබා දීම අත් හිටුවා ඇති අතර නිපදවන ලද පැල දිසාව තුළ වෙනත් රුක් රෝපණ කටයුතු සඳහා භාවිතා කිරීමට උපදෙස් ලබා දී ඇත.
09.	නිසි ඇස්තමේන්තුවකින් තොරව පැළ තවන් කර තිබීම හා කාර්යක්ෂම ලෙස බෙදාහැර නොතිබීම.	ඒ ඒප්‍රදේශවල වාර්ෂික පැල ඉල්ලුම අනුව වඳවී යන ශාක ප්‍රමාණය , මෙම වසර තුළ තවත් පැළ ලක්ෂ 7ක පමණ ප්‍රමාණයක් නිෂ්පාදනය කරන ලද බවත් ප්‍රකාශ කළ දෙපාර්තමේන්තු නිලධාරීන් දේශීය ආයතන විසින් සිදුකරන ඉල්ලීම් ප්‍රකාරව එම පැල ලබා දීම සිදු කරන බව ප්‍රකාශකරන ලදී.	2020 – 2023 දක්වා නිෂ්පාදනය කරන ලද පැල කොවිඩ් වසංගතය හා , රටේ පැවති අනෙකුත් අර්බුද හේතුවෙන් අපේක්ෂිත පරිදි විකිණීමට හා රුක් රෝපණ වැඩසටහන් සඳහා යොදා ගැනීමට නොහැකි විය.එසේම ජාතික අයවැය දෙපාර්තමේන්තුව මගින් "2022 අයවැය ඇස්තමේන්තුවල ඇතුලත් හඳුනාගත් වියදම් අවුරා තැබීම" මැයෙන් නිකුත් කරන ලද අංක MF/NBD/11CM/2022/140 හා 2022.08.17 දිනැති

			ලිපිය මගින් දෙපාර්තමේන්තු වියදම් අවුරා තැබීම හේතුවෙන් නිෂ්පාදනය කරන ලද පැල වගා කිරීමට ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති විය. එහෙත් තවාන්වල ඉතිරි පැල නිසි පරිදි නඩත්තුව සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමට සිදුවිය. 2020-2023 වර්ෂවල නිෂ්පාදනය කරන ලද තවාන් වල ඉතිරිව තිබූ පැළ "වනාන්තර වලින් පිටත පැල මිලියනයක් සිටුවීමේ වැඩසටහන" යටතේ සිටුවීමට හා, 2024 හා 2025 වර්ෂවල අනුමත වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත්ව තිබූ රුක් රෝපණ වැඩසටහන් වලට යොදාගැනීමට, මුදලට විකිණීමට කටයුතු කර ඇති අතර, දැනට දෙපාර්තමේන්තුවේ තවාන් වල එම පැරණි පැල සීමිත ප්‍රමාණයක් ඉතිරිව ඇති බව නිරීක්ෂණය වේ. ඒවාද මෙම වසර තුළ දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබන විවිධ රුක් රෝපණ වැඩසටහන් හා රජයේ ආයතන හා පාසල් සමඟ ඒකාබද්ධව සිදු කරන රුක් රෝපණ වැඩසටහන් සඳහා යොදවා ගැනීමට කටයුතු කරනු ලැබේ. දැනට මෙම අංශය මගින් වාර්ෂික පැළ ඉලක්කය සැකසීමේදී තවාන් වල ඉතිරිව පවතින පැල ප්‍රමාණය අධ්‍යයනය කර ඇස්තමේන්තු සකස් කිරීම සිදු කරනු

			ලබයි. ඒ අනුව පසුගිය වසරවල නිශ්පාදිත ඉතිරි පැලද භාවිතා කිරීමට හැකියාවක් තිබූ බැවින් 2024 ,2025 ,2026 පැල නිෂ්පාදන ඉලක්කය අඩු කිරීමටද කටයුතු කර ඇත.
10.	ත්‍රිකුණාමලය යාන්ඔය ඩෙල්ටාවේ වැලි ගොඩදැමීම.	එම ක්‍රියාවලිය මඟින් කඩොලාන රක්ෂිතයට හානියක් සිදුවී නොමැති බවත් , එහි තිබෙන විවෘත ප්‍රදේශයකට වැලි ගොඩදමා තිබෙන බවත් , දෙපාර්තමේන්තුව මඟින් වැලි ගොඩ දැමීමේ බලපත්‍ර 05ක් නිකුත් කර තිබෙන අතර එම බලපත්‍ර ද මේ වසර වන විට අහෝසිකර තිබෙන බවත් , වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ග.නි.විසින් කාරක සභාව හමුවේ ප්‍රකාශ කළේය.එමෙන්ම ගව පට්ටි වනාන්තර තුළට ඇතුළු වීම ද වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මුහුණ දී තිබෙන ගැටළුවක් බව එම නිලධාරීන් විසින් පෙන්වා දෙන ලදී.	තවදුරටත් එම ස්ථානයේ බලපත්‍ර ලබා දී නොමැත. ඉඩම් බලපත්‍ර වලට අදාල ඉඩම් ඉවත් කර ඉතිරි කොටස් රක්ෂිත ලෙස ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කරමින් පවතී.
11.	කොන්ත්‍රාත් පදනම මත ගල් කැඩීම සඳහා ලබාදුන් ගල්කොරි බලපත්‍ර අනුව ගල් කැඩීමෙන් අනතුරුව හැරුණු වළවල් නිසි පරිදි නොපිරවීම නිසා ජලය පිරුණු වලවල් බවට පත්ව තිබීම සහ ඇතැම් තැන් හි එම වළවල්	එහි දී ත්‍රිකුණාමලය කිළිකොංපිමලේ ගල්කොරිය සම්බන්ධයෙන් ද විමසූ අතර එය තවම ක්‍රියාත්මක ගල්කොරියක් බව වන ජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි/ග.නි විසින් කාරක සභාව වෙත දන්වන ලදී.මෙම ගල්කොරි බලපත්‍ර ලාභීන්ගෙන් තැම්පතුවක් රදවා තබාගෙන තිබෙන බවත් , අදාළ ගිවිසුම් කාලය අවසන් වීමට පෙර එම වළවල් වසා	කළුගල් ඉවත් කිරීමට අවසර ලබාදෙන විට කොන්දේසි අනුව කටයුතු කරන්නේ ද යන්න සොයා බලන ලෙසත් ඒ සම්බන්ධව විමසීමෙන් සිටින ලෙසත් සියළුම දිසා වන නිලධාරීන් වෙත සහ ක්ෂේත්‍ර නිලධාරීන් වෙත දැනුම් දී ඇත.

	වලට කසල බැහැර කිරීම ආදී කටයුතු නිසා පාරිසරික ගැටලු රාශියකට මුහුණ පා තිබීම.	දැමිය යුතු බවත් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ග.නි. සඳහන් කළේය.	
12.	වනසංරක්ෂණ දෙපාර්තමේන්තුවට මධ්‍යගත දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම.	මේ සඳහා අවශ්‍යය දත්ත පද්ධතිය සකස් කර තිබෙද යන්න පිළිබඳව කාරක සභාව විමසිය. අදාළ දත්ත පද්ධතිය ඉහත 07 කරුණෙහි සඳහන් වනාන්තර ගැසට් කිරීමේ වැඩපිළිවෙළ හි ප්‍රාදේශීය මට්ටමින් ප්‍රගතිය වාර්තා කළ හැකි අයුරින් , සකස් විය යුතු බව .කාරක සභාව පෙන්වා දුන්නේ ය. ඒ අනුව ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 25 පුරා විසිරී සිටින දෙපාර්තමේන්තු නිලධාරීන්ට දත්ත ඇතුළත් කිරීම හා දත්ත ලබා ගැනීමට හැකිවන පරිද්දෙන් මධ්‍යගත දත්ත පද්ධතියක් ක්‍රියාත්මක කිරීම සඳහා දින වකවානු ඇතුළත් වාර්තාවක් සකස් කර 2024 සැප්තැම්බර් 25 දින වන විට කාරක සභාව වෙත යොමු කරන· ලෙස වන ජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි/ග.නි වෙත කාරක සභාව විසින් නිර්දේශ කරන ලදී.	මධ්‍යගත තොරතුරු පද්ධතියට තොරතුරු ඇතුළත් කිරීම අදාළ ප්‍රධාන කාර්යාලයේ අංශයන් විසින්ම සිදුකිරීම සඳහා ඒ ඒ අංශ සඳහා User Accounts වෙන්කර දී ඇත. එමනිසා දත්ත යාවත්කාලීන කිරීම් ද එම අංශයන් විසින්ම සිදුකරනු ලබයි.
13.	වනසංරක්ෂණදෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ගල් කැණීමේ බලපත්‍රයන්ට අදාළ හිඟ ආදායම් අයකර ගැනීම.	ප්‍රථමයෙන් ම වන ජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයට අයත් සන්නිවේදන කුළුනු ලේඛනය සකස් කරන ලෙසත් , ඒ අතුරින් ගාස්තු නොගෙවූ සමාගම් පිළිබඳ ලේඛනයක් කාරක සබාව වෙත ඉදිරිපත් කරන ලෙසත් වන ජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි/ග.නි වෙත කාරක සභාව විසින් නිර්දේශ කරන ලදී.	මේ සම්බන්ධව 2024/02/26 දින අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කරන ලද අමාත්‍යා මණ්ඩල සංදේශ 3.1 නිර්දේශය සමහ අමාත්‍ය මණ්ඩලය එකහ නොවීම නිසා 3.2 නිර්දේශය අනුව හිඟ ගාස්තු ගෙවා නොමැති බලපත්‍රකරුවන්ගේ කැණීම් බලපත්‍ර අත්හිටුවීමටත් ඔවුන්ගෙන් රජයට අයවිය යුතු ගාස්තුව නීතිමය

		ඉදිරියේ දී ගල් කොරි බලපත්‍රයන්ට අදාළව වෙඩි බෙහෙත් නිකුත් කරනු ලබන ප්‍රමාණය නිර්ණය කර ඊට අනුරූපීයව බදු මුදල තීරණය කරන ලෙසත් ඒ සඳහා භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය සමඟ ඒකාබද්ධ ක්‍රමවේදයකට අනුව කටයුතු කරන ලෙසත් , ඒ සම්බන්ධයෙන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නිර්දේශය ද සඳහන් කරමින් ආරක්ෂක අමාත්‍යාංශය වෙත ලිඛිතව දන්වන ලෙසත් , වන ජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි/ග.නි වෙත කාරක සභාව විසින් නිර්දේශ කරන ලදී. ගල් කොරි බලපත්‍රයන්ට අදාළ හිඟ ගාස්තු ගෙවීම් සිදු නොකළ ආයතන 143 සඳහා හිඟ ගාස්තු ගෙවන ලෙසට අවසාන නිවේදනය යැවීමෙන් පසු ද ගෙවීම් සිදු නොකරන ආයතන අසාධු ලේඛන ගත කරන ලෙසත් (Backlist) , අදාළ බලපත්‍ර හිමියන්ගේ නම් වලින් ලබාගෙන තිබෙන වෙනත් බලපත්‍ර තිබේනම් ඒවා ද අහෝසි කරන ලෙසත් සන්නිවේදන කුළුණු ගාස්තු සම්බන්ධයෙන් අදාළ සන්නිවේදන සමාගම් එකම දිනයක කැඳවා අදාළ ගාස්තු ගෙවීම් සඳහා අවසන් දිනයක් නියම කර එදින වන විට ගාස්තු ගෙවා අවසන් කරන ලෙස දන්වා සිටින ලෙසත් වන ජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි/ග.නි වෙත කාරක සභාව විසින් නිර්දේශ කරන ලදී.	ක්‍රියාමාර්ගයක් ගැනීම තුළින් අයකර ගැනීමටත් කටයුතු කරන ලෙස අනුමැතිය ලැබී ඇත. එම අමාත්‍ය මණ්ඩල අනුමැතිය සම්බන්ධයෙන් මාගේ අංක DFC/PLE/6/61/2021 හා 2025.02.07 හා 2025.05.28 දිනැති ලිපි යොමු කර ඇති අතර 2025.11.23 දින නීතිපති දෙපාර්තමේන්තුවේ අතිරේක සොලිස්ටර් ජනරාල් විකුම් ද ආබෘ මහතා සමඟ සාකච්ඡාවක්ද පවත්වා ඇත. එම සාකච්ඡාවෙන් අනතුරුව නීතිපතිවරයා විසින් අංක E/62/2025 හා 2025.12.23 දිනැති ලිපිය මඟින් උපදෙස් ලබාදී ඇත්තේ මෙම ප්‍රමාණය ඉක්මවා කළුගල් ඉවත් කිරීම සම්බන්ධව වන සංරක්ෂණ අඥා පනතේ ප්‍රතිපාදන මඟින් නඩු පවරා රජයේ ගාස්තු අයකරගැනීමට ප්‍රමාණවත් සාක්ෂි නොමැති බවයි. ඒ අනුව එකි බලපත්‍රකරුවන්ගෙන් මුදල් අයකරගැනීමට එන්තරවාසි යැවීමට කටයුතු කරන ලෙසත් ඉන් අනතුරුව ගෙවීම පැහැර හරින පුද්ගලයින් සම්බන්ධයෙන් වන සංරක්ෂණ අඥා පනතේ 68වගන්තිය යටතේ කටයුතු කලහැකි බවත්ය. මෙම හිඟ ගාස්තු ගණනය කිරීම සිදුකල කමිටුව තීරණය කර ඇත්තේ ලබාගත් පුපුරණ ද්‍රව්‍ය පදනම් කරගෙන හිඟ ගාස්තු ගණනය කිරීමටයි. ඒ සඳහා භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශයෙන් ලබාගෙන ඇති පුපුරණ ද්‍රව්‍ය පාදක කරගෙන මෙම හිඟ ගාස්තු ගණනය සිදුකර ඇත.

			එවැනි ගණනය කිරීමක් මඟින් ලබාගන්නා දත්ත මත පමණක් අපරාධ නඩුවක් අධිකරණයේ ගොනුකර රජයට ලැබිය යුතු ගාස්තු අයකර ගැනීම ගැටලු සහගත විය හැකිය. ඒ අනුව, දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද කළුගල් කැණීමේ බලපත්‍රයන්ට අදාල හිඟ ගාස්තු අයකර ගැනීමට අමාත්‍ය මණ්ඩල සංදේශයක් කෙටුම්පත් කර ඇති අතර එය අමාත්‍ය මණ්ඩල වෙත ඉදිරිපත් කිරීමට ඉදිරියේදී කටයුතු කරමි.
14.	වනජ සම්පත් තිරසර අයුරින් නෙලා ගැනීම.	දිස්ත්‍රික් මට්ටමින් තොරතුරු ලබාගෙන ශ්‍රී ලංකාවේ වනාන්තරවලින් ලබාගත හැකි සම්පත් හඳුනාගෙන , ඒවා තිබෙන ස්ථාන සහ එම සම්පත් තිරසාරව නෙලා ගැනීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රමවේද / මාර්ගෝපදේශ අදාළ දිස්ත්‍රික් කාර්යාල සඳහා නිකුත් කරන ලෙස වන ජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි/ග.නි වෙත කාරක සභාව විසින් නිර්දේශ කරන ලදි.	2023/4 දරණ වන සංරක්ෂණ නියෝගවල සඳහන් වනජ ද්‍රව්‍ය වනාන්තරවල තිරසර පැවැත්මට හානි නොවන ලෙස ලබාදීමට කටයුතු සිදු කරනු ලැබේ.

වෛද්‍ය දම්මික පටබැඳි
පරිසර අමාත්‍ය